# අනුරාධපුර යුගයේ කාන්තා භූමිකාව පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (අනුරාධපුර යුගයේ ශිලා ලේඛන ඇසුරෙන් )

එච්. ඩබ්. එම්. ජී. එස්. එස්. හේරත්
කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය
herathshani14@gmail.com

**සාරසංක්ෂේපය**

ලක්දිව ඉතිහාසය විමසා බලන විට අනුරාධපුර යුගයට අදාළ සමාජීය, දේශපාලනික, ආර්ථික හා සංස්කෘතික වශයෙන් විද්‍යමාන සාක්ෂ්‍ය බොහෝ ප්‍රමාණයක් ශිලාලේඛනාශ්‍රයෙන් සපයාගත හැකි ය. ඓතිහාසික තොරතුරු මූලාශ්‍රය විමසා බලන විට කුවේණිය, සංඝමිත්තා තෙරණිය, අනුලා බිසව, හේමමාලා කුමරිය ආදි ප්‍රභූ කාන්තාවන් පිළිබඳ තොරතුරු හමු වුව ද සාමාන්‍ය කාන්තාවන් පිළිබඳ තොරතුරු සඳහන් වන්නේ ඉතා අල්ප වශයෙනි. ඒ අනුව ක්‍රි.පූ. 3වන සියවස සිට 10වන සියවස තෙක් අතීත ලංකාවේ කාන්තාවන් පිළිබඳ තොරතුරු ගවේශනාත්මක ව අධ්‍යයනය කිරීම හා අනුරාධපුර යුගයේ කාන්තාවට තත්කාලීන සමාජයේ කුමන ආකාරයේ ජීවන රටාවක් උරුම වූවා දැයි යන්න විමර්ශනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ වී ඇත. ප්‍රධාන වශයෙන් **epigraphia zeylanika** සහ **Inscriptions of Ceylon** කෘති පාදක කොට ගෙන තොරතුරු රැස්කොට එම කෘතිවල කාන්තාවන් පිළිබඳ ව සඳහන් වන සෙල්ලිපි, ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ විශ්ලේෂණය කෙරුණි. එසේ අනුරාධපුර යුගයට අයත් ශිලාලේඛනවල සඳහන් තොරතුරු අනුව පැහැදිලි වන කරුණක් නම් අනුරාධපුර යුගයේ කාන්තාව සමාජයේ වැදගත් ස්ථානයක් හිමිකර ගෙන සිටි බව යි. එමෙන් ම රහතන් වහන්සේ, භික්ෂූන් වහන්සේ, භික්ෂුණීන් වහන්සේ වෙනුවෙන් ලෙන් පූජාකිරීමේ දී මූලිකත්වය ගෙන කටයුතු කළ පිරිස අතර කාන්තාවට ද ප්‍රමුඛස්ථානයක් හිමි ව තිබේ. රජ කෙනෙකු විසින් රචිත සෙල්ලිපි බොහෝ ප්‍රමාණයක රජු හැඳින්වීමට රජුගේ මව පිළිබඳ ව තොරතුරු සඳහන් කළ ද, ලෙන් ලිපි රචනා කිරීමේ දී ඒ එක් එක් කාන්තාවගේ පියා හෝ ස්වාමිපුරුෂයා පිළිබඳ ව ද සඳහන් කරමින් ඇය කවරෙකුගේ දියණියක දැයි, කවරෙකුගේ බිරිඳක දැයි යන අනන්‍යතාව පෙන්වා දීමට කටයුතු කළ බව අනාවරණය වේ. ඒ අනුව අනුරාධපුර යුගයේ කාන්තාව සමාජ, දේශපාලන, ආර්ථික හා ආගමික කටයුතු සඳහා සක්‍රීය ව තම දායකත්වය ලබා දී ඇති දැයි යන අධ්‍යයනයට අවශ්‍ය සාධක බොහෝ ප්‍රමාණයක් ශිලාලේඛනවල සඳහන් ව තිබිණි.

**ප්‍රමුඛ පද: අනුරාධපුර යුගය, කාන්තාව, දේශපාලනය, සමාජය, සෙල්ලිපි**

# An Investigative Study of the Role of Women in the Anuradhapura Period (Based on the Inscriptions of the Anuradhapura Period)

H.W.M.G.S.S.Herath
University of Kelaniya – Kelaniya
herathshani14@gmail.com

## Abstract

When examining the history of Sri Lanka, a lot of social, political, economic, and cultural evidence of the Anuradhapura period can be provided from inscriptions. When examining the sources of historical information, although there is a considerable amount of information about elite women such as *Kuveni, Therani Sanghamitta, Queen Anula, Princess Hemamala,* etc., less information is mentioned about ordinary women. Accordingly, the objective of this research is to investigate the information about women in Sri Lanka from the 3rd century BC to the 10th century and to investigate what kind of lifestyle the women of the Anuradhapura era inherited in that society. Mainly based on the work *Epigraphia Zeylanika* and *Inscriptions of Ceylon* data were gathered and inscriptions that contain information about women were analysed under qualitative research method. According to the information mentioned in the inscriptions belonging to the Anuradhapura period, it is clear that women occupied an important position in society during the Anuradhapura period. Also, women played a prominent place among the people who took the initiative in offering caves for arahants, bhikkhus, and bhikkhunis. Although many of the inscriptions written by a king mentioned about mother of the king to refer to the king, it is revealed that when writing cave letters, the father or husband of each woman was mentioned to show the identity of the daughter and whose wife she is. Thus, it can be concluded that the women of the Anuradhapura period have actively contributed to social, political, economic, and religious affairs.

.**Keywords:** Anuradhapura Period, Inscriptions, Politics, Role of Women Society